**පොලිස් ත්‍යාග අරමුදල - 2019**

------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

පොලිස් ත්‍යාග අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පොලිස් ආඥා පනතේ 73(4) වගන්තිය (65 අධිකාරය) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 150 ඡේදය ප්‍රකාරව තම අස්ථිත්වය සම්බන්ධයෙන් නීතිමය, ව්‍යවස්ථාපිත තත්ත්වයන් සහ අස්ථිත්වයේ මෙහෙයුම් හා මූලික කාර්යයන්හි ස්වභාවය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරවු කළ යුතු වුවද, එසේ හෙළිදරවු කිරීම් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලස්ම තුල අන්තර්ගත කර ඇත. ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කිරිමට කටයුතු කරමි. | අදාල තොරතුරු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොලිස් කොට්ඨාශ 02 ක් වෙත සාමාන්‍ය අග්‍රිමය යටතේ ලබා දී තිබූ රු.20,450,725 ක් හා රථවාහන අග්‍රිමය යටතේ ලබා දී තිබූ රු.2,407,870 ක් 2020 වර්ෂයේදී ආපසු මුදලින් පියවා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකම ආදායම් ප්‍රකාශනයේ සාමාන්‍ය අග්‍රිම වියදම හා රථ වාහන ත්‍යාග අග්‍රිම වියදම ලෙස ඇතුලත් කර තිබුණි. | 2020 වර්ෂයේදී සමුච්චිත අරමුදලට සිදුකරන ගැලපීම් මගින් 2019 වර්ෂයේ සිදුවූ ගිණුම් කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාල වියදම් නිවැරදි හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ අධිකරණ 11 කින් ලැබිය යුතු උසාවි දඩමුදල් ලෙස රු.1,967,615 ක් දක්වා තිබුණද, 2020 වර්ෂයේදී රු.3,582,828 ක් ලැබී තිබීම හේතුවෙන් රු.1,615,213 කින් ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද අධිකරණ 04 කින් ලැබිය යුතු උසාවි දඩමුදල් ලෙස රු.11,017,998 ක් දක්වා තිබුණද 2020 වර්ෂයේදී රු.3,265,230 ක් පමණක් ලැබී තිබීම හේතුවෙන් රු.7,752,767 කින් ලැබිය යුතු උසාවි දඩමුදල් ආදායම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති. ලැබිය යුතු උසාවි දඩමුදල් ආදායමට වඩා 2020 වර්ෂයේදී ලද රු.1,231,035 ක මුදල මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කරනු ලැබේ.<br>රු.7,843,845 ක මුදලක් ලැබිය යුතු උසාවි දඩ මුදල් ලෙස වැඩිපුර දක්වා තිබීම ජනල සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂය අග ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පත් පොළී ආදායම ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.4,688,010 ක් වැඩියෙන් හා පොළී ආදායම වැරදි අනුපාත මත ගණනය කිරීම හේතුවෙන් රු.4,981,809 ක් අඩුවෙන් ද ආයෝජන ආදායම වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වර්ෂයට අදාල පොළී ආදායම නිවැරදි හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ස්ථාවර තැන්පතු 4 කට අදාලව ගිණුම් ගත කරන ලද පොළියට වඩා කල්පිරීමේදී රු.1,066,640 ක් වැඩියෙන් ද, තවත් ස්ථාවර තැන්පතු 7 කට අදාලව ගිණුම් ගතකරන ලද පොළියට වඩා රු.4,928,632 ක් අඩුවෙන්ද ලැබී තිබුණ ද ඒ සඳහා අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වර්ෂයට අදාල පොළී ආදායම නිවැරදි හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.2.2 නොසැසඳුණු පාලන ගිණුම් ශේෂ

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ 28 ක උසාවි දඩ මුදල් ආදායම් තහවුරු කිරීමේ ලිපි හා මූල්‍ය ප්‍රකාශන | අධිකරණ 22 කින් ලැබිය යුතු උසාවි දඩ මුදල | උසාවි දඩමුදල් ආදායම නිවැරදිව |

| | | |
|---|---|---|
| සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනය සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ මුදල් ආදායම අධිකරණ 16කින් රු.6,481,780 ක් අඩුවෙන්ද, අධිකරණ 12 කින් රු.43,258,080 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | රු.1,453,981 ක් අඩුවෙන් ද, අධිකරණ 13 කින් රු.43,258,080 ක් ද වැඩිපුර සටහන් වී ඇති අතර මෙම වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | හඳුනාගෙන ගිණුම් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය සෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හා අරමුදල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හා විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාල සීමාව තුල සහ අදාල නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/ 2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ චක්‍රලේඛයේ 04 ඡේදයේ (අ) , (ඇ) හා (ඊ) වගන්ති ප්‍රකාරව ඇතුළත් විය යුතු කරුණු අරමුදලට අදාලව ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්වී නොතිබුණි. | පොලිස් ත්‍යාග අරමුදලේ සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණු යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

### 2.2. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොලිස් අනුග්‍රාහක අරමුදලට අත්තිකාරම් ලෙස ලබා දී තිබූ රු.2,000,000 ක් වර්ෂ 19 කට වැඩිකාලයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකර ගිණුම්වල දක්වා තිබුණි. | ගිණුම් වලින් ඉවත් කිරීමට ඇති හැකියාව පරීක්ෂාකර ඉදිරි කටයුතු කරමි. | අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) විශේෂ වැටලීම් සඳහා අරමුදලින් ත්‍යාග ගෙවීමේදී නඩු අවසන් වීමට පෙර සියයට 50 ක අත්තිකාරම් මුදලක් ගෙවන අතර ඉතිරි ත්‍යාග මුදල් උසාවි නඩු කටයුතු අවසන් වීමෙන් පසුව ගෙවනු ලබයි. එසේ වුවද නඩු කටයුතු අවසන් නොවීම මත නඩු ලිපිගොනු 381 කට අදාලව එකතුව 85,064,711 ක් වූ ත්‍යාග වර්ෂ 01 ත් වර්ෂ 18 ත් අතර කාල පරාසයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | අධිකරණ කටයුතු අවසන් වූ වහාම ඉතිරි ත්‍යාග මුදල ගෙවන ලෙස ගෙවීම් කාර්යාල වෙත දැනුම් දීමට කටයුතු කරමි. | ගෙවිය යුතු විශේෂ ත්‍යාගයන්ට අදාල නඩු කටයුතු අවසන් වීමේ ප්‍රගතිය කෙරෙහි සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා පසුවිපරම් කටයුතු සිදුකල යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා මාස 15 ක් වෙනුවෙන් උසාවියකින් ලැබිය යුතු උසාවි දඩ මුදල් එකතුව රු.1,285,832 ක මුදල අරමුදලට ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. | පේදුරුතුඩුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතු ත්‍යාග මුදල් සොයා බලා කටයුතු කිරිමට පොලිස් අධිකාරි යාපනය කොට්ඨාශය වෙත දැනුම් දී ඇත. අධිකරණ රෙජිස්ටාර් වෙතද දැනුම් දී ඇත. | ආදායම් රැස්කිරීම ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ස්ථානීය දඩ මුදල් අයකර ගැනීමේ ප්‍රමාදයන් අඛණ්ඩව නිරීක්ෂණය වූ අතර දිස්ත්‍රික් 20 කට අයත් 2018 හා ඊට පෙර ලැබිය යුතු රු.22,269,797 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ අතර දිස්ත්‍රික්ක 2 කින් 2017 ට පෙර ලැබිය යුතු රු.492,040 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | ස්ථානීය දඩමුදල් නියමිත පරිදි ත්‍යාග අරමුදල බැරකරන ලෙසට දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රා.ලේ. කා. විටින් විට දැනුවත්කර ඇත. දිගින් දිගටම ප්‍රමාදවීම නිසා 2020.06.16 දිනැති ලිපියෙන් නැවත දැනුවත් කර ඇත. | ආදායම් රැස්කිරීම ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කල යුතුය. |

## 2.3 කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුළු ආදයම රු. මිලියන 3,467 ක් වුවද ත්‍යාග සඳහා වියදම රු.මිලියන 906 ක් වූයෙන් අරමුදලේ අපේක්ෂිත අරමුණු වෙනුවෙන් දායක වීම වර්ෂයේ ආදායමෙන් සියයට 26 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. | 2020 වර්ෂයේදී කොට්ඨාශ කාර්යාල සඳහා ත්‍යාග ගෙවීම වෙනුවෙන් අනුමත කර ඇති අග්‍රිම සීමාවන් උපරිම ලෙස යොදාගෙන ත්‍යාග ගෙවීමට කටයුතු කරන ලෙස ගෙවීම් කාර්යාල දැනුවත් කර ඇත. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කිරීමට ප්‍රමුඛතාවය හිමිවිය යුතුය. |
| (ආ) | රථවාහන රාජකාරීවල නියුතු නිලධාරීන් විසින් රථවාහන දඩමුදල් ආදායම් ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු. මිලියන 1,219 ක් අරමුදලට රැස්කර දී තිබුණි. එසේ වුවද රථවාහන ත්‍යාග සඳහා රු. මිලියන 194 ක් එනම් ආදායමින් සියයට 16 ක් පමණක් වැය කර තිබුණි. | පෙර වර්ෂයට සාපේක්ෂව රථ වාහන දඩ ආදායම සියයට 29 කින් වැඩි වී ඇතත් ත්‍යාග ගෙවීම් වැඩවීම සියයට 14 කි. ඉදිරියේදී රථවාහන ත්‍යාග ගෙවීම වැඩි වීමක් සිදුවේයැයි අපේක්ෂිතය. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කිරීමට ප්‍රමුඛතාවය හිමිවිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී අරමුදල උපයා තිබූ මුළු ආදායම රු. මිලියන 3,467 ක් විය. එම කාල පරිච්ඡේදය තුල රු. මිලියන 2,483 කින් අරමුදලේ ආයෝජන වර්ධනය වී තිබුණි. අරමුදලේ අපේක්ෂාව ආදායමින් සියයට 80 ක් ත්‍යාග ගෙවීම හා සුභ සාධන කටයුතු සඳහා වැය කිරීම වුවද මුළු ආදායමට සාපේක්ෂව සියයට 71 ක් ආයෝජන වර්ධනය කර ගැනීම වෙනුවෙන් වැයකර තිබුණි. | කාරක ප්‍රාග්ධනයේ අතිරික්තය ස්ථාවර තැන්පතුවල අයෝජනය කරනු ලැබේ. එය අරමුදලෙහි මූල්‍ය ස්ථාවරත්වය සහ අඛණ්ඩ පැවැත්ම ස්ථාවර කරනු ලබයි. ඉදිරියේදී පොලී ආදායම මත නිලධාරීන්ගේ සුභසාධනය සඳහා වැඩ පිලිවෙලක් සකස්කර ක්‍රියාත්මක කරමි. | අරමුදලේ ස්ථාවර තැන්පතු වටිනාකම වාර්ෂිකව වර්ධනය වන නමුත්, අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකිරීමට ප්‍රමුඛතාවය හිමිවිය යුතුය. |

## 2.4 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 4,694 ක් ස්ථාවර තැන්පතු මත පොලී ආදායම් ලෙස උපයාගෙන තිබුණද මෙම ආදායම් අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අරමුදල අවධානය යොමුකර නොතිබුණි. | රටතුල උද්ගතවී ඇති මූල්‍යමය හා වෙනත් අහිතකර සාධක මත අරමුදලේ ස්ථාවරත්වයට සහ අඛණ්ඩ පැවැත්මට සිදුවිය හැකි බලපෑම මත ස්ථාවර මූල්‍ය පදනමක් තිබීම ඉතා අත්‍යවශ්‍ය වී ඇත. | ස්ථාවර තැන්පතු ආදායම් අරමුදල පිහිටුවීමේ අරමුණ සඳහා යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණය කල යුතුය. |